## බස්නාහිර පළාත් ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය

**1. ක්‍රියාත්මක වන දිනය :**

මෙම ගුරු සේවා ව්‍යවස්ථාව අනුමත කරන දිනය දක්වා ක්‍රියාත්මක වූ අංක 843/4 හා 1994.10.31 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද ගුරු සේවා ව්‍යවස්ථාවට හා එහි සංශෝධනයන්ට අගතියක් නොවන පරිදි මෙම ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2008.07.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (XII) හි උපලේඛන II හි සඳහන් වැටුප් ක්‍රම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2010 හි 2.3 ඡේදයේ දැක්වෙන විධිවිධාන වලට යටත්ව, 2011.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

**2. පත් කිරීමේ බලධරයා :**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

සටහන -1 ව්‍යවස්ථාවේ 7.2.1 හි i හා ii ලෙස සඳහන් වන අධ්‍යාපනවේදී උපාධිධාරීන් හා උපාධිධාරීන් පත්කිරීමේ බලධාරියා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

සටහන -2 ව්‍යවස්ථාවේ 7.2.1 හි iii, iv හා v ලෙස සඳහන් වන ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන්, ඩිප්ලෝමාධාරීන් හා අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් ලැබුවන් තෝරා ගැනීම, බඳවා ගැනීම හා පුහුණුව ලබා දීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයෙන් සිදු කිරීමෙන් පසු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පළාත් රාජ්‍ය සේවය සඳහා පත්වීම් ලබා දෙනු ඇත.

**3. සේවා ගණය/ සේවා ගණ :**

**3.1.** සේවා ගණය : බස්නාහිර පළාත් ගුරු සේවය.

**3.2.** ශ්‍රේණි :

| | |
|---|---|
| 3 පන්තිය | - II ශ්‍රේණිය |
| 3 පන්තිය | - I (ඇ) ශ්‍රේණිය |
| 3 පන්තිය | - I (ආ) ශ්‍රේණිය |
| 3 පන්තිය | - I (අ) ශ්‍රේණිය |
| 2 පන්තිය | - II ශ්‍රේණිය |
| 2 පන්තිය | - I ශ්‍රේණිය |
| 1 පන්තිය | |

**4. සේවාවේ පොදු කාර්යය භාරය :**

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ඉහළ ගුණාත්මක් භාවයෙන් යුත් අධ්‍යාපනයක් තුළින් පරිපූර්ණ පුරවැසියෙක් බිහි කිරීම පිණිස පළාත් පාසල් වල ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, පාසල් අධ්‍යාපනයට අදාල පළාත් මට්ටමේ සහ අනෙකුත් විභාග හා ඇගයීම් පැවැත්වීමට අදාළ කාර්යය, පාසල් විෂයය සමගාමී කාර්යය සහ පළාත විසින් අධ්‍යාපන ක්‍රියාවලියට අදාලව පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු යැයි තීරණය කරනු ලබන කාර්යය ගුරුවරුන් විසින් ඉටු කළ යුතු වේ.

**7.2.2.2.** කායික හා මානසික යෝග්‍යතාවය

සෑම අපේක්ෂකයෙකුම ගුරුවරයකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**7.2.2.3.** වයස

7.2.2.3.1. අවම සීමාව : අවුරුදු 18 යි.
7.2.2.3.2. උපරිම සීමාව : අවුරුදු 35 යි.

**7.2.2.4.** අනෙකුත් අවශ්‍යතා.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
(ඇ) බස්නාහිර පළාතේ වසර 03ක ස්ථිර අඛණ්ඩ පදිංචිය තිබිය යුතුය.
(ඈ) බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.
(ඉ) සුදුසුකම් ලබන දිනය - බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට / සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබෙනම් පමණි.

**7.2.3.** **බඳවා ගැනීමේ ක්‍රමය :**

7.2.3.1. 3 පන්තිය II ශ්‍රේණිය

සේවයට බඳවා ගැනීම 7.2.4.1 හි සඳහන් පරිදි ලිඛිත තරඟ විභාගය සහ 7.2.4.4. හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ 7.2.4.2. හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත මෙම ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ " සටහන - 2" පරිදි පළාතේ පවත්නා පුරප්පාඩු අනුව සිදු කරනු ලැබේ.

7.2.3.2. 3 පන්තිය I (ඇ) ශ්‍රේණිය

සේවයට බඳවා ගැනීම 7.2.4.1 හි සඳහන් පරිදි ලිඛිත තරඟ විභාගය සහ 7.2.4.4. හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ 7.2.4.2 හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත මෙම ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ " සටහන - 2" පරිදි පළාතේ පවත්නා පුරප්පාඩු අනුව සිදු කරනු ලැබේ.

7.2.3.3. 3 පන්තිය I (ආ) ශ්‍රේණිය

පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම මෙම ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ " සටහන - 2" පරිදි වන අතර සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වූ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මත පළාතේ පවත්නා පුරප්පාඩු අනුව සිදු කරනු ලැබේ.

7.2.3.4. 3 පන්තිය I (අ) ශ්‍රේණිය

සේවයට බඳවා ගැනීම 7.2.4.1 හි සඳහන් පරිදි ලිඛිත තරග විභාගය සහ 7.2.4.4. හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මඟින් සහ 7.2.4.2. හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත මෙම ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ " සටහන - 1" පරිදි පළාතේ පවත්නා පුරප්පාඩු අනුව සිදු කරනු ලැබේ.

7.2.3.5. 2 පන්තිය - II ශ්‍රේණිය

සේවයට බඳවා ගැනීම 7.2.4.4. හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ 7.2.4.2. හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත මෙම ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ " සටහන - 1" පරිදි පළාතේ පවත්නා පුරප්පාඩු අනුව සිදු කරනු ලැබේ.

7.2.4. විභාග ක්‍රමය :

7.2.4.1. ලිඛිත තරඟ විභාගය -

| විෂයය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය - (කාලය පැය 01යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම - (කාලය පැය 01 යි) | 100 | 40 |

"අ" පරිශිෂ්ටය බලන්න.

7.2.4.1.1. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල්/ පත්වීම් බලධාරියා/පත්වීම් බලධරයා විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟිනි.

7.2.4.2. ප්‍රායෝගික පරීක්ෂණය.

මෙම පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය ලබා ගත යුතුය.

"ආ" පරිශිෂ්ටය බලන්න.

7.2.4.3. බස්නාහිර පළාත් ගුරු සේවය සඳහා තෝරා ගැනීමේ ක්‍රමය :

තෝරා ගැනීම අවස්ථානුකූලව තීරණය කරනු ලබන පළාත් පදනම හෝ පාසල් පදනම යන දෙකෙන් එක් පදනමක් යටතේ කරනු ලැබේ.

**ව්‍යවස්ථාවේ 7.2.3.4. හි සඳහන් විධිවිධාන යටතේ බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ ක්‍රමය.**

**7.2.4.3.1.**

**(අ) පළාත් පදනම**

ව්‍යවස්ථාවේ 7.2.4.1 හි සඳහන් ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් අතුරින් ඔවුන්ගේ ලකුණු වල එකතුව මත කුසලතා අනුපිළිවෙල අනුව පළාතේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් 7.2.4.2. හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉන් අනතුරුව ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු හා ඔවුන් විසින් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු වල ද එකතුව අනුව ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල තීරණය කරනු ලැබේ. ඒ අනුව පළාතේ පුරප්පාඩු අනුව පත්වීම් ලබා දෙනු ලැබේ.

**(ආ) පාසල් පදනම**

i. ව්‍යවස්ථාවේ 7.2.4.1 හි සඳහන් ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන එම පාසලට ඉල්ලුම් කල අයදුම්කරුවන් අතරින් එම පරීක්ෂණයේ ලකුණු වල එකතුව මත වූ කුසලතා අනුපිළිවෙල අනුව එම පාසලේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර, ඉන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් 7.2.4.2. හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ඉන් සමත්වන අයදුම්කරුවන් ඔවුන් විසින් ප්‍රායෝගික පරීක්ෂණයේදී හා ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුව අනුව ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල තීරණය කරනු ලැබේ. ඒ අනුව පුරප්පාඩු මත පත්වීම් ලබා දෙනු ලැබේ.

ii. ඉහත 7.2.4.3.1 (ආ) (i) හි සඳහන් ක්‍රියාවලිය පරිදි ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවන අයදුම්කරුවන් අතරින් යම් පාසලකට සුදුසුකම් ලැබුවන් නොමැති අවස්ථාවකදී 7.2.4.2. හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම් නොකළ 7.2.4.1 හි සඳහන් ලිඛිත විභාගය සමත් එම පාසලට ඉල්ලුම් කල අයදුම්කරුවන් අතරින් නැවත 7.2.4.3.1 (ආ) (i) හි ක්‍රියාවලිය අනුගමනය කර තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

iii. යම් පාසලකට කිසිදු අයදුම්කරුවකු ඉල්ලුම්කර නොමැති අවස්ථාවක දී හෝ කිසිඳු අයදුම්කරුවකු 7.2.4.3.1. (ආ) (i) හා 7.2.4.3.1. (ආ) (ii) අනුව සුදුසුකම් ලබා නොමැති අවස්ථාවකදී හෝ එබඳු පාසලක් සඳහා බඳවා ගනු ලබන්නේ වෙනත් පාසල් සඳහා අයදුම් කළ 7.2.4.1 හි සඳහන් ලිඛිත විභාගය සමත් වූ අය අතරින් කැමැත්ත විමසා 7.2.4.3.1. (ආ) හි ක්‍රියාවලිය අනුගමනය කර ඔවුන් ලබා ගෙන ඇති කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබීමෙනි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් ... දිනය : ...
ගොනු අංකය : ...

**7.2.4.3.2.**

**ව්‍යවස්ථාවේ 7.2.3.5. හි සඳහන් විධිවිධාන යටතේ බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ ක්‍රමය.**

i. ඉල්ලුම් කළ අයදුම්කරුවන් 7.2.4.4. හි පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබ, ඒ අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් 7.2.4.2. හි පරිදි ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ii. ව්‍යවස්ථාවේ 7.2.4.2. හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ඔවුන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදුකර අදාල පරිදි පළාතේ පවත්නා පුරප්පාඩු අනුව පත්වීම් ලබා දෙනු ලැබේ.

**7.2.4.3.3.**

**ව්‍යවස්ථාවේ 7.2.3.3 හි සඳහන් විධිවිධාන යටතේ බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ ක්‍රමය.**

i. (තෝරා ගැනීම හා පුහුණු කිරීම මධ්‍යම රජය විසින් සිදු කරනු ලබන අතර පළාතේ අවශ්‍යතාව පරිදි සුදුසුකම් සපුරන ලද ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් පළාත් රාජ්‍ය සේවයට බඳවා ගැනීම සඳහා පළාතට යොමු කරනු ලැබේ.) පළාතට යොමු කරන ලද සුදුසුකම් සපුරා ඇති ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් පළාතේ පවත්නා පුරප්පාඩු අනුව 7.2.4.4. හි සඳහන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් බස්නාහිර පළාතේ පවත්නා පුරප්පාඩු අනුව පළාත් රාජ්‍ය සේවය සඳහා ස්ථානගත කරනු ලැබේ.

සටහන 9 - පාසල් පදනම අනුව බඳවා ගැනීමේදී පළමු පත්වීම ලබන පාසලේ සේවය කල යුතු කාල පරිච්ඡේදය බඳවා ගන්නා අවස්ථාවේදී පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

**7.2.4.4.** **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය** : ලකුණු ලබා දෙනු නොලැබේ.

**සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය.**

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

**7.2.4.5.** **ප්‍රායෝගික පරීක්ෂණය.**

7.2.4.2. අනුව ගුරු වෘත්තියේ දී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම.

**7.2.4.6.** **සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**7.2.5.** **අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :**

රජයේ ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කිරීම මගින් හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඊට අමතරව වෙබ් අඩවියේ ද දැන්වීම් පළ කළ හැක.

**7.2.6.** **ශ්‍රේණියක සිට තවත් ශ්‍රේණියකට පත් කිරීම.**

**7.2.6.1.** **සේවයේ 3- II ශ්‍රේණියේ සිට 3- I ශ්‍රේණියට පත් කිරීම.**

i. විධිමත් පරිදි උපාධි සුදුසුකම් ලබා ගත් විට 3- I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.
ii. ගුරු පුහුණුව සම්පූර්ණ කළ විට 3- I (ආ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ආ) අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දුරස්ථ ක්‍රමය මගින් නොවසරකට නොඅඩු ගුරු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර ලබා ගනු ලබන සහතික පත්‍රය වේ.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් ප්‍රතිසංවිධිත බස්නාහිර පළාත් ගුරු සේවයේ ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණය කිරීම බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පහත දැක්වෙන පරිදි සිදු කරනු ලැබේ.

**14.1 සේවයේ 3- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

සේවයේ 3- II ශ්‍රේණියේ සිටින පත්වීමට අදාලව නියම කර ඇති අධ්‍යාපන සුදුසුකම් සහිත ගුරුවරුන් බස්නාහිර පළාත් ගුරු සේවයේ 3- II ශ්‍රේණියට ද,

**14.2 සේවයේ 3- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

(අ) සේවයේ 3- I ශ්‍රේණියේ සිටින ව්‍යවස්ථාවේ 7.2.2.1 (ආ) හි සඳහන් සුදුසුකම් සහිත ගුරුවරුන් බස්නාහිර පළාත් ගුරු සේවයේ 3- I (ඇ) ශ්‍රේණියට ද,

(ආ) සේවයේ 3- I ශ්‍රේණියේ සිටින ව්‍යවස්ථාවේ 7.2.2.1 (ඇ) හි සඳහන් සුදුසුකම් සහිත ගුරුවරුන් බස්නාහිර පළාත් ගුරු සේවයේ 3- I (ආ) ශ්‍රේණියට ද,

(ඇ) සේවයේ 3- I ශ්‍රේණියේ සිටින ව්‍යවස්ථාවේ 7.2.2.1 (ඇ) හි සඳහන් සුදුසුකම් සහිත ගුරුවරුන් බස්නාහිර පළාත් ගුරු සේවයේ 3- I (අ) ශ්‍රේණියට ද,

අන්තර්ග්‍රහණය කළ යුතු ය.

**14.3 සේවයේ 2- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

සේවයේ 2- II ශ්‍රේණියේ සිටින ගුරුවරුන් බස්නාහිර පළාත් ගුරු සේවයේ 2- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතුය.

**14.4 සේවයේ 2- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

සේවයේ 2- I ශ්‍රේණියේ සිටින ගුරුවරුන් බස්නාහිර පළාත් ගුරු සේවයේ 2- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතුය.

**14.5 සේවයේ 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම.**

සේවයේ 1 ශ්‍රේණියේ සිටින ගුරුවරුන් බස්නාහිර පළාත් ගුරු සේවයේ 1 වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතුය.

සටහන 13 : අන්තර්ග්‍රහණය කිරීම මත වැටුප් පරිවර්තනය කිරීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (XII) හි උපලේඛන II හි සඳහන් පරිවර්තන වගුව සහ චක්‍රලේඛයේ 3.3 ඡේදය යටතේ සිදුකළ යුතු ය. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද්දේ දිනය 2017/6/20
ගොනු අංකය : 605/ADM/2/7/221

